# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,723- 2011 සැප්තැම්බර් මස 09 වැනි සිකුරාදා - 2011.09.09**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | 1326 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 1326 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | 1330 |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 1331 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | 1335 |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 1337 |
| විවිධ දැන්වීම් ... ... ... | — |


*සැ. යු.*- ජාතික පොලිස් අභ්‍යාස ආයතනය පනත් කෙටුම්පත 2011 අගෝස්තු මස 19 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2011 සැප්තැම්බර් මස 16 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2011 සැප්තැම්බර් මස 02 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2011 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

1325- B 080357—8,900 (2011/09)

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ප්‍රසම්පාදන දැන්වීමයි

ශ්‍රී ලංකා දුම්රිය සේවය සඳහා සකම්පන (Vibrating) රෝලර් (Rollers) 03 ක් (තුනක්) සැපයීම (ප්‍රසම්පාදනය)

01. කොළඹ 10, ඕල්කට් මාවතේ පිහිටි දුම්රිය මූලස්ථානයේ, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (ප්‍රධාන) සභාපති විසින්, සකම්පන (Vibrating) රෝලර් (Rollers) 3 ක් සැපයීම සඳහා සැපයුම්කරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු භාරගනු ලැබේ.

02. කොළඹ 10, ඕල්කට් මාවතේ, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ සාමාන්‍යාධිකාරිතුමාගේ කාර්යාලයේ දී 2011.10.06 වැනි දින ප.ව. 2.00 ට ලංසු භාරගැනීම අවසන් කෙරෙනු ඇත.

03. ආපසු ගෙවනු නොලබන රු. 5000.00 ක් (රුපියල් පන්දහසක් පමනක්) වන ගාස්තුව ගෙවීමෙන් අනතුරුව 2011.10.04 වැනි දින ප.ව. 3.00 දක්වා, කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයෙන්, ලබාගත හැකි ආකෘති පත්‍රවල (ෆෝර්මවල) පමනක් ලංසු ඉදිරිපත් කළ යුතුය.

04. ලංසු භාර ගන්නා වේලාව අවසන් වූ වහාම, කොළඹ 10, ඕල්කට් මාවතේ, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ සාමාන්‍යාධිකාරි කාර්යාලයේදී ලංසු විවෘත කරනු ලබන අතර, එම අවස්ථාවට ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ.

05. මුද්‍රා තබන ලද ලංසු පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි කළ තැපෑලෙන් එවීම හෝ අතින් ගෙනැවිත් භාරදීම හෝ කළ හැකිය :–

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),
ශ්‍රී ලංකා දුම්රිය සේවා මූලස්ථානය,
ඕල්කට් මාවත, කොළඹ 10.

06. වැඩිදුර විස්තර ලබාගැනීම සඳහා කරුණාකර විමසන්න :

දුම්රිය ගබඩා අධිකාරි,
තැ. පෙ. 1347, ඕල්කට් මාවත, කොළඹ 10.
දුරකථන අංක : 94(11) 2432044 හෝ 94 (11) 2436818
ෆැක්ස් අංක : 94 (11) 2432044
ඊමේල් :srs@sierra.lk

සභාපති
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමු අංක : SRS/F 6877

09-354

# බඩු බාහිරාදිය විකිණීම්

**කොළඹ ප්‍රධාන මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද නඩු භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

01. කොළඹ ප්‍රධාන මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාල රාජසන්තක කරන ලද, හිමිකම් නොකියන ලද හා නඩු අංක සොයාගත නොහැකි වූ පහත සඳහන් භාණ්ඩ 2011.09.24 දින පෙ.ව. 10.00 ට මෙම අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. මෙහිදී වෙන්දේසි කරනු ලබන කිසියම් භාණ්ඩයක් පිළිබඳව අයිතිවාසිකම් කියන්නෙකු වේ නම් ඒ පිළිබඳව වෙන්දේසිය පවත්වනු ලබන දින පෙ.ව. 9.00 සිට පෙ.ව. 10.00 දක්වා ස්වකීය අයිතිවාසිකම් ඉදිරිපත් කළ යුතුය.

03. වෙන්දේසිය ආරම්භ කිරීමට පැය 1/2 කට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය පරිදි මහජනයාට පරීක්ෂා කර බැලිය හැකි වේ.

04. වෙන්දේසියෙන් මිලදී ගන්නා භාණ්ඩ ඒ අවස්ථාවේදීම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු අතර, සියලුම ගෙවීම් මුදල්වලින් පමණක් කළ යුතුය.

05. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවේදී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කිරීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

06. වෙන්දේසියෙන් භාණ්ඩ ඉල්ලීමට පැමිණෙන්නන් තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතුය.

07. වෙන්දේසිය සම්බන්ධයෙන් පැමිණිලි කිසිවක් තිබේ නම් වෙන්දේසිය පවත්වන අවස්ථාවේදී ඉදිරිපත් කළ යුතු අතර, වෙන්දේසියෙන් පසුව ලැබෙන පැමිණිලි කිසිවක් භාරගනු නොලැබේ.

රශ්මි සිංගප්පුලි,
ප්‍රධාන මහෙස්ත්‍රාත්.

2011 සැප්තැම්බර් 09 වැනි දින,
කොළඹ ප්‍රධාන මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**වෙන්දේසිය සඳහා නියමිත භාණ්ඩ ලැයිස්තුව**

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 01. | - | ප්ලාස්ටික් පුටු | 02 |
| 02. | - | අබලන් කුඩා ලී කබඩ් | 02 |
| 03. | - | ලී පෙට්ටි කොටස් | 01 |
| 04. | - | වානේ කබඩ් ලාච්චු | 04 |
| 05. | - | රබර් හෝස් කෑබලි තොගය | |
| 06. | - | අබලන් පරිඝණක පුටු | 01 |
| 07. | - | ලොරි රිම් | 02 |

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 08. | - | 3' x 3' ප්‍රමාණයේ තහඩු ෆ්‍රේම් සහිත වීදුරු රවුම් | 02 |
| 09. | - | ලී පටි තොගය | |
| 10. | - | කොළ පාට ප්ලාස්ටික් දැල් රෝල් | 01 |
| 11. | - | කුෂන් සහිත අබලන් වානේ පුටුව | |
| 12. | - | උළු කැට | 20 |
| 13. | - | 5' x 5' රවුම් හැඩයේ ග්‍රිල් ගේට්ටු | 01 |
| 14. | - | රිම් එක සහිත විවිධ ප්‍රමාණයේ ටයර් | 03 |
| 15. | - | රිම් එක සහිත විවිධ ප්‍රමාණයේ ටයර් | 03 |
| 16. | - | යතුරු පැදි ටයර් | 03 |
| 17. | - | ජංගම වෙළඳාම් කරත්ත | 01 |
| 18. | - | අබලන් පාපැදි | 08 |
| 19. | - | අබලන් පාපැදි කොටස් තොගය | |
| 20. | - | 3' ප්‍රමාණයේ වීදුරු | 01 |
| 21. | - | අබලන් වානේ අල්මාරි | 02 |
| 22. | - | අබලන් සිවිලින් ෆෑන් කොටස් තොගය | |
| 23. | - | අබලන් කුඩා යකඩ මේස | 01 |
| 24. | - | ඇළුමිනියම් කොටස් තොගය | |
| 25. | - | 1' x 1' ප්‍රමාණයේ යකඩ පට්ටම් | 50 |
| 26. | - | විවිධ වර්ගයේ යකඩ කම්බි කොටස් මිටි | 01 |
| 27. | - | කුඩා පෝසිලේන් සින්ක් | 01 |
| 28. | - | රබර් පාපිස්ස | |
| 29. | - | 10' ප්‍රමාණයේ ටකරන් | 08 |
| 30. | - | ඇස්බැස්ටෝස් ෂීට් | 05 |
| 31. | - | කල්කිරි බෝතල් රඳවන | 01 |
| 32. | - | විශාල ප්‍රමාණයේ ඉටිකැබලි | 04 |
| 33. | - | 15" x 18" ප්‍රමාණයේ යකඩ ප්ලේට් | 01 |
| 34. | - | යකඩ රවුම් | 01 |
| 35. | - | පිඟන් ගඩොල් කැට | 350 |
| 36. | - | නිල් පාට මේස විදුලි පංකා | 01 |
| 37. | - | (i) සාරි | 03 |
| | | (ii) සුදු කලිසම් රෙදි | 01 |
| | | (iii) ඉරි සරම් | 08 |
| 38. | 4373/5 | සෝනි DVD යන්ත්‍ර | 01 |
| 39. | 82927/4 | කැම්ටෙක්ස් වර්ගයේ බිත්තියට සවිකරන කැමරා | 01 |
| 40. | 84403/3 | Hyundai ජංගම දුරකථන | 01 |
| 41. | 84400/3 | මෝටරෝලා ජංගම දුරකථන | 01 |
| 42. | - | පැනසොනික් වර්ගයේ කැසට් රෙකෝඩර | 01 |
| 43 | - | R 850 මාදිලියේ සීරියල් අංක 9040142 දරන RICOH වර්ගයේ වීඩියෝ කැමරා | |
| 44. | - | අබලන් කාර් කැසට් | 03 |
| 45. | - | JVC වර්ගයේ ඩෙක් යන්ත්‍ර | 01 |
| 46. | - | ටෙලිසොනික් වර්ගයේ බිත්ති ඔරලෝසු | 01 |
| 47. | - | පැනසොනික් වර්ගයේ ලොකු කැසට් | 01 |
| 48. | - | ප්ලෑෂ් ලයිට් | 01 |
| 49. | - | Talent වර්ගයේ ඩෙක් යන්ත්‍ර | 01 |
| 50. | - | නැෂනල් වර්ගයේ කැසට් | 01 |
| 51. | - | අයිවා වර්ගයේ කැසට් | 01 |
| 52. | - | නැෂනල් පැනසොනික් වර්ගයේ පරණ රේඩියෝ | 01 |
| 53. | - | (i) අබලන් විදුලි ස්ත්‍රික්ක | 01 |
| | | (ii) පැති කණ්නාඩි යුගල | 01 |
| 54. | - | සැම්සුන්ග් ST - 125 දරන කැසට් | 01 |
| 55. | - | පැති කණ්ණාඩි | 04 |
| 56. | - | මේන් ස්විච් එක සහිත ස්විච් බෝඩ් | 01 |
| 57. | - | සංඥා පහන් | 02 |
| 58. | - | නැෂනල් වර්ගයේ බෆල් රහිත කැසට් | 01 |
| 59. | - | සවල් | 05 |
| 60. | - | ළමා ඇඳුම් කට්ටල | 05 |
| 61. | - | මේස තරාදි | 10 |
| 62. | - | CD කවර අඩංගු උර | 01 |
| 63. | - | යකඩ කපන කතුරු | 01 |
| 64. | - | තංගුස් නූල් අඩංගු උර | 03 |
| 65. | - | ලවුඩ් ස්පීකර් හෝන් | 03 |
| 66. | - | නූල් කෝන් පෙට්ටි | 01 |
| 67. | - | ෆෑන් මෝටර් | 10 |
| 68. | - | ඇළුමිනියම් සින්ක් | 01 |
| 69. | - | ක්‍රිකට් පිති | 12 |
| 70. | - | සුදු යකඩ බාර් | 04 |
| 71. | - | කටු කම්බි රෝල් | 03 |
| 72. | - | ත්‍රිරෝද රථ ආසන | 02 |
| 73. | - | බිත්ති ඔරලෝසු | 02 |
| 74. | - | ඇළුමිනියම් මුට්ටි | 01 |
| 75. | - | එළවළු සැකසීමේ උපකරණ පෙට්ටි | 03 |
| 76. | - | වතුර මෝටර් | 01 |
| 77. | - | වට තුනේ ගෑස් ලිප් | 01 |
| 78. | - | සුදුපාට ප්ලාස්ටික් පුටු | 02 |
| 79. | - | කුඩා සාස්පාන් කට්ටල | 01 |
| 80. | - | කැසට් රෙකෝඩර | 01 |
| 81. | - | වාහන බැටරි | 05 |
| 82. | - | ඇළුමිනියම් සින්ක් | 01 |
| 83. | - | ගෝල්ෆ් පිති | 02 |
| 84. | - | එක්සෝස් ෆෑන් | 01 |
| 85. | - | බිම් පොලිෂ් කරන උපකරණ | 01 |
| 86. | - | අච්චා වර්ගයේ කැසට් | 01 |
| 87. | - | බෆල් | 02 |
| 88. | - | දොර හැඬල් අඩංගු පෙට්ටි | 01 |
| 89. | - | වතුර මෝටර් | 01 |
| 90. | - | කුඩා වාහන ජැක් | 01 |
| 91. | - | අත්බුරුම | 03 |
| | | ඇලිස් කටු | 01 |
| 92. | - | විදුලි ස්ත්‍රික්ක | 01 |
| 93. | - | විදුලි ග්‍රයින්ඩර් | 01 |
| 94. | - | ලොකු ග්‍රයින්ඩර් | 01 |
| 95. | - | වාහන පැති කණ්නාඩි | 06 |
| 96. | - | කුඩා සාස්පාන් | 01 |
| | | ප්ලාස්ටික් බේසම් | 01 |
| 97. | - | මේස තරාදි | 01 |
| 98. | - | කැඩීගිය භූමිතෙල් ලාම්පු | 01 |
| 99. | - | ඩෙක් යන්ත්‍ර | 01 |
| | | බිත්ති ඔරලෝසු | 01 |
| 100. | - | වාහන සංඥා පහන් | 02 |
| 101. | - | බිත්ති ඔරලෝසු | 03 |
| 102. | - | ත්‍රිරෝද රථ මඩ කවර | 04 |
| 103. | - | සිවිලින් විදුලිපංකා මෝටර් | 02 |
| 104. | - | සන්යෝ වර්ගයේ රතු පැහැති කැසට් | 01 |
| 105. | - | වාහන කැසට් | 01 |
| 106. | - | ඇම්ප් | 01 |
| | | ස්පීකර් | 01 |
| 107. | - | පාට පැන්සල්, පාට කූරු, ප්ලැටිග්නම්, ගම්, මකන කැබලි, කුඩා කතුරු අඩංගු උර | 01 |
| 108. | - | නැෂනල් පැනසොනික් කැසට් | 01 |
| 109. | - | කුඩා කැසට් රෙකෝඩර් | 01 |

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 110. | - | වාහන පැති කණ්නාඩි | 06 |
| 111. | - | පැනසොනික් ඩෙක් යන්ත්‍ර | 01 |
| 112. | - | නැෂනල් වර්ගයේ ඩෙක් යන්ත්‍ර | 02 |
| 113. | - | යුනික් වර්ගයේ කුඩා කැසට් | 01 |
| 114. | - | ග්‍රයින්ඩර් තල | 18 |
| 115. | - | යතුරු පැදි පෝක් | 01 |
| 116. | - | විදුලි ස්ත්‍රික්ක | 01 |
| 117. | - | බිත්ති ඔරලෝසු | 01 |
| 118. | - | ඉන්ටර් නැෂනල් වර්ගයේ කුඩා කැසට් | 01 |
| 119. | - | රතුපාට ගමන් බෑග් | 01 |
| 120. | - | ඇළුමිනියම් මුට්ටි | 01 |
| 121. | - | ගල් කටු තල | 01 |
| | | නියන් | 01 |
| | | කරාම | 01 |
| | | යතු කැට | 02 |
| 122. | - | සෝනි වර්ගයේ ඩෙක් යන්ත්‍ර | 01 |
| 123. | - | පැති කණ්නාඩි | 02 |
| 124. | - | ඩෙක් යන්ත්‍ර | 02 |
| 125. | 86536/3 | 8' x 4' ප්‍රමාණයේ වීදුරු | 01 |
| | | වීදුරු බෝල් | 01 |
| | | 8' x 4' ප්‍රමාණයේ හාඩ් බෝඩ් ෂීට් | 01 |
| 126. | A5858/4 | i. සෝනි එරික්සන් ජංගම දුරකථන | 01 |
| | | ii. 3310 නොකියා ජංගම දුරකථන | 01 |
| | | iii. මෝටරෝලා ත්‍රී ජී ජංගම දුරකථන | 01 |
| | | iv. යූ 8110 ජංගම දුරකථන | 01 |
| | | v. සීමන් වර්ගයේ ජංගම දුරකථන | 01 |
| | | vi. 5210 නොකියා බැටරිය රහිත ජංගම දුරකථනය | 01 |
| | | vii. TV200 දරන චයිනීෂ් ජංගම දුරකථන | 01 |
| | | viii. මෝටරෝලා ජංගම දුරකථන | 01 |
| 127. | - | අබලන් සිවිලිං ෆෑන් | 01 |
| 128. | - | අබලන් හාන්සි පුටු | 01 |
| 129. | - | පිත්තල සීනු | 01 |
| 130. | - | කොළ පැහැති ප්ලාස්ටික් දැල් රෝල් | 02 |
| 131. | - | ටකරන් | 04 |
| 132. | - | ත්‍රීවීලර් රථ සීට් | 03 |
| 133. | - | යතුරුපැදි සීට් | 03 |
| 134. | - | ඇඹින් මැෂින් | 02 |
| 135. | - | විදුලි ස්විච් බෝඩ් | 01 |
| 136. | - | කුඩා රෙදි රෝල් | 01 |
| 137. | - | කොමඩ් කොටස් | 02 |
| 138. | - | හිස් ප්ලාස්ටික් බෝතල්, වීදුරු බෝතල් හා ප්ලාස්ටික් බූලි තොගය. | |

09-335

---

## දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - මොණරාගල

## ප්‍රසිද්ධ නඩු භාණ්ඩ වෙන්දේසිය

මොණරාගල දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ රාජ සන්තක කරන ලද හා හිමිකම් නොපෑ පහත විස්තර සඳහන් භාන්ඩ, 2011.09.24 දින පෙ.ව. 9.30 ට අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කෙරේ.

01. භාණ්ඩ මිලදී ගැනීමේ දී ජාතික හැඳුනුම්පත අනිවාර්යයෙන් ඉදිරිපත් කළ යුතුය.

02. භාණ්ඩ වෙන්දේසිය ආරම්භ කිරීමට පැයකට පෙර භාණ්ඩ අධිකරණ රෙජිස්ට්‍රාර්වරයා ගේ අධීක්ෂණය යටතේ පරීක්ෂා කර බැලිය හැක.

03. යම් භාණ්ඩයක් සඳහා හිමිකම් පාන්නකු වේ නම් වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර එය ලේඛණ ඉදිරිපත් කරමින් සනාථ කළ යුතුය.

04. මිලදී ගැනීමේ දී මුදලින් පමණක් ගෙවීම් කළ යුතු අතර චෙක්පත් භාර ගනු නොලැබේ.

05. තක්සේරු කළ භාණ්ඩවල අවම ලංසුව තක්සේරු වටිනාකමවන අතර එම වටිනාකම භාණ්ඩ වෙන්දේසියට ඉදිරිපත් කරන අවස්ථාවේ දී පමණක් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

06. අනෙකුත් භාණ්ඩ සියල්ලක් සඳහාම අවම ලංසුව අධිකරණය තීරණය කරන අතර අවම ලංසුව පිළි නොගන්නා අවස්ථාවක එය වෙන්දේසියෙන් ඉවත් කිරීමේ බලය අධිකරණය සතුය.

07. භාණ්ඩ මිලදී ගැනීමට පැමිණෙන ගැණුම්කරුවන් ගේ උනන්දුවට හානි වන ආකාරයේ ප්‍රකාශයන් හෝ වෙනත් බලපෑම් කිරීම සපුරා තහනම්ය.

08. මිලදී ගත් භාණ්ඩ එසැනින් අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු අතර මිලදී ගත් භාණ්ඩ වෙනුවෙන් පසු වගකීම් භාර ගනු නොලැබේ.

ටී. එම්. චින්තක ශ්‍රීනාත් ගුණසේකර,
දිසා විනිසුරු හා මහෙස්ත්‍රාත්,
දිසා අධිකරණය - මොණරාගල.

2011 අගෝස්තු මස .23 වැනි දින,
මොණරාගල දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය | |
|---|---|---|---|
| 01. | 41860 | දම්වැල් කියත් 01 යි. | (ඔරිගන් වර්ගයේ) |
| 02. | 42079 | එම | (ඔලිමැක් වර්ගයේ) |
| 03. | 48289 | එම | (ඩී. බී. එල්. වර්ගයේ) |
| 04. | 42864 | එම | (කොමට්සු වර්ගයේ) |
| 05. | 45302 | එම | (සඳහන් නොවේ) |
| 06. | 48252 | එම | (ජී. ඩී. කේ. වර්ගයේ) |
| 07. | 38112 | එම | (ස්තිල් වර්ගයේ) |
| 08. | 40362 | එම | (ඔලිමැක් වර්ගයේ) |
| 09. | 24656 | එම | (සඳහන් නොවේ) |
| 10. | 41414 | එම | (හවායිස්ට් වර්ගයේ) |
| 11. | 40679 | එම | (එප්කෝ වර්ගයේ) |
| 12. | 22506 | එම | (සඳහන් නොවේ) |
| 13. | 34325 | එම | (ඔලිමැක් වර්ගයේ) |
| 14. | අංක මැකී ඇති | තහඩු බැරල් 08 යි | |
| 15. | එම | ප්ලාස්ටික් බකට් 02 යි | |
| 16. | එම | ප්ලාස්ටික් බැරල් 02 යි | |
| 17. | එම | පොඩි ඇලුමිනියම් මුට්ටි 04 යි | |
| 18. | එම | ලොකු ඇලුමිනියම් මුට්ටි 05 යි | |
| 19. | එම | ටයර් කරත්ත රෝද කොටස් 03 යි | |
| 20. | එම | කරත්ත රෝද 02 යි | |
| 21. | එම | පාවිච්චි කරන ලද කැති 10 යි | |
| 22. | එම | පාවිච්චි කරන ලද උදලු 10 යි | |

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය | |
|---|---|---|---|
| 23. | එම | පාවිච්චි කරන ලද සවල් 10 යි | |
| 24. | එම | පාවිච්චි කරන ලද පොරෝ 08 යි | |
| 25. | එම | පාවිච්චි කරන ලද ඇඳුම් උදලු 03 යි | |
| 26. | අංක හඳුනා ගත නොහැකි | වයර් කැබලි අඩංගු පාර්සල් 10 යි | |
| 27. | 36742 | අත් ට්‍රැක්ටර් ට්‍රේලරය | |
| 28. | 37153 | එම | |
| 29. | අංක රහිත | කළුගල් කියුබ් 1/4 යි | |
| 30. | බීආර් 92/2011 | දඟර වානේ කම්බි 19 යි | |
| 31. | අංක රහිත | යකඩ ඉනි 03 යි | |
| 32. | අංක රහිත | පිහි 02 යි | |
| 33. | අංක රහිත | හිස් වීදුරු බෝතල් තොගයක් | |
| 34. | අංක රහිත | හිස් කෑන් 40 යි | |
| 35. | අංක රහිත | හිස් කෑන් 40 යි | |
| 36. | අංක රහිත | හිස් බූලි 08 යි | |
| 37. | අංක රහිත | හෙල්මට් 07 යි | |
| 38. | | වානේ කැබිනට් (ලාච්චු 4) අබලි 03 යි | භාණ්ඩ සමීක්ෂණය 2010 අනුව වෙන්දේසි කිරීමට නියමිත භාණ්ඩ |
| 39. | | ලී කැබිනට් 02 යි අබලි | |
| 40. | | ලී අල්මාරි 03 යි අබලි | |
| 41. | | යකඩ අල්මාරි 01 යි අබලි | |
| 42. | | කවුලු සහිත කබඩ් 03 යි අබලි | |
| 43. | | පිත්තල කොන්ඩ් පට්ටම් 05 යි | |

09-367

---

**මහෙස්ත්‍රාත් අධිකරණය - බිබිල**

අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද රාජසන්තක කරනු ලැබූ හා හිමිකම් නොපාන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

01. බිබිල මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළව රාජසන්තක කරනු ලැබූ හා හිමිකම් නොපාන ලද පහත සඳහන් භාණ්ඩ 2011.10.15 වන දින පෙරවරු 10.00 ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි පහත සඳහන් භාණ්ඩවලට හිමිකම් පාන්නකු වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දිනට පෙර ස්වකීය හිමිකම් ලියවිල්ලක් මගින් අධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙත ඉදිරිපත් කළ යුතු ය.

03. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ඇතිව වෙන්දේසියට පැය භාගයකට පෙර විකිණීමට නියමිත භාණ්ඩ මහජනයාට පරීක්ෂා කර බැලිය හැක.

04. අධිකරණය මගින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවලදී අධිකරණයේ අභිමතය පරිදි එම ද්‍රව්‍ය වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියේ දී මිලදී ගනු ලබන ද්‍රව්‍යයන් එවෙලේම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය. සියලු ගෙවීම් මුදලින් කළ යුතු අතර චෙක්පත් භාර ගනු නොලැබේ.

06. වෙන්දේසියෙන් මිලදී ගන්නා ද්‍රව්‍ය සඳහා ගැණුම්කරුවන් විසින් තමන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කල යුතු ය.

ලක්මල් වික්‍රමසූරිය,
මහෙස්ත්‍රාත් - බිබිල.

2011 ක් වූ අගෝස්තු 16 වැනි දින,
බිබිල මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

| නඩු අංකය | නඩු භාණ්ඩ විස්තරය |
|---|---|
| නඩු අංක රහිත | උදලු තල 25 - මිට සහිත 10 |
| නඩු අංක රහිත | පොරෝ තල 12 |
| නඩු අංක රහිත | සවල් 03 |
| නඩු අංක රහිත | කුලුගෙඩි 02 |
| 14153 | හිස් ගෑස් සිලින්ඩර් 01 |
| 1724 | හිස් ගෑස් සිලින්ඩර් 01 |
| අංක රහිත | වැලි කියුබ් 05 ක් පමණ |
| අංක රහිත | හිස් බෝතල් කීපයක් |
| අංක රහිත | හිස් කෑන් කීපයක් |
| අංක රහිත | හිස් බූලි කීපයක් |
| අංක රහිත | හිස් බැරල් කීපයක් |
| අංක රහිත | ඇඳි රහිත (ලී) පුටු 01 |
| අංක රහිත | එනමල් ජෝග්ගු 01 |
| අංක රහිත | ඇඳි පුටු (ලී) 01 |
| අංක රහිත | ලිපිගොනු ට්‍රේ 02 |
| අංක රහිත | එනමල් තැටි 01 |
| අංක රහිත | එනමල් බේසම් 02 |
| අංක රහිත | යකඩ ඇඳන් 01 |
| අංක රහිත | බිත්ති ඔරලෝසු 01 |
| අංක රහිත | නඩු පොත් රාක්ක 01 (අබලන්) |
| අංක රහිත | ලී අල්මාරි (අබලන්) 01 |
| අංක රහිත | හකුලන බුරු ඇඳන් (අබලන්) 01 |
| අංක රහිත | කේතල 03 |
| අංක රහිත | ලී රාක්ක 02 |
| අංක රහිත | උයන භාජන 07 (දිග මිට) |
| අංක රහිත | ගෑරුප්පු 01 |

09-229

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

**2012 වර්ෂය සඳහා රා තැබෑරුම් රේන්ද විකිණීම - දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

2012 ජනවාරි මස 01 වැනි දින සිට 2012 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා කාලය තුළ පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රා තැබෑරුම්වල පැසුණු රා සිල්ලරට විකිණීමේ සම්පූර්ණ වරප්‍රසාද මිල දී ගැනීම සඳහා 1982 අගෝස්තු 20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 207 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද රා විකිණීමේ කොන්දේසිවලට ද යටත්ව 2011.09.22 වැනි දින පෙ.ව. 10.30 දක්වා මා විසින් ටෙන්ඩර්පත් කැඳවනු ලැබේ.

රා රේන්ද ලබා ගැනීමට ඉදිරිපත්වන අය ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක් නිසියාකාරව සම්පූර්ණ කර මෙහි පහත දක්වා ඇති අනුමත රා තැබෑරුම් ලැයිස්තුවෙන් නියම කර ඇති ටෙන්ඩර් මුදල ගෙවා ලබාගත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල කුවිතාන්සියකින් ද, ප්‍රකාශිත රේන්ද කොන්දේසි මත ලබාගත් වත්කම් සහතිකයක් ද සහිතව මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම් කෙළවරේ තමන් ටෙන්ඩර් කරනු ලබන තැබෑරුම් අංකය සහ නම ද පැහැදිළිව ලියා ඒ ඒ තැබෑරුම් සඳහා මෙහි දැක්වෙන ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන වේලාවට පෙර ලියාපදිංචි කරන ලද තැපෑලෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන්නට සැළැස්විය හැක.

ටෙන්ඩර්කරු විසින් ටෙන්ඩර් පත්‍ර සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර්පත්‍රවල පළකරනු ලබන සෑම වෙනස් කිරීමක් ම ටෙන්ඩර්කරුවන්ගේ සම්පූර්ණ අත්සන් යෙදීමෙන් සනාථ කළ යුතු ය. එසේ නොවන ටෙන්ඩර්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය වන 2011.09.22 වැනි දින පෙ.ව. 10.30 ට සියලුම ටෙන්ඩර්කරුවන් මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

කිසියම් කරුණක් සඳහන් නොකොට ඇති ටෙන්ඩර් පත්‍රිකාව හෝ සියල්ලම ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් සතු වේ.

පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් නැවත විකිණීම 2011.11.21 වැනි දින පෙ. ව. 10.30 ට සිදු කරනු ලැබේ. එදින ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම ගැසට් නිවේදනයේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතු ය.

මේ වරප්‍රසාද මිලදී ගත් තැනැත්තා යැයි ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව එකී ප්‍රකාශ කළ දින එනම් රේන්ද විකුණුම් දින ප.ව. 2.00ට පෙර දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලබන මුදලින් මාස දෙකක රේන්ද මුදල් කොටසකට වැඩි මුදලක් ඇප තැන්පත් වශයෙන් ඔහුට ගෙවා තැබෑරුම් පිළිබඳ කොන්දේසිවලට අත්සන් කළ යුතු ය.

ටෙන්ඩර් ඉදිරිපත් කිරීමේ දී දැනගත යුතු වෙනත් විස්තර ඇත්නම් ඒවා දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකිය.

එච්. එම්. එල්. එස්.හේරත්,
ප්‍රාදේශීය ලේකම්,
දිවුලපිටිය.

2011 ක් වූ අගෝස්තු මස 17 වැනි දින,
දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

*උපලේඛනය*

| *අනුක්‍රමික අංකය* | *තැබෑරුමේ නම සහ අංකය* | *කොට්ඨාසය* | *තැබෑරුම පිහිටුවිය යුතු ප්‍රාදේශීය කොට්ඨාසය* | *තැබෑරුම විවෘත කරන වේලාව* | *තැබෑරුම වසන වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල් රු.* | *ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය හා වේලාව* |
|---|---|---|---|---|---|---|---|
| 01 | දාගොන්න 27 | දිවුලපිටිය | දාගොන්න | පෙ.ව. 11.00<br>ප.ව. 5.00 | ප.ව. 2.00<br>ප.ව. 8.00 | 4,000 | 2011.09.22<br>පෙ.ව. 10.30 |

09-228

# රජයේ නොවන දැන්වීම්

## 2007 අංක 07 දරන සමාගම් පනතේ 09 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

සමාගමේ නම : යුරෝඅයිකෝන් (ප්‍රයිවට්) ලිමිටඩ්
අංකය : පී. වී. 80591
දිනය : 2011.08.11
ලියාපදිංචි ලිපිනය : අංක 172, අලුත්කඩේ වීදිය, කොළඹ 12.

සී. පාලිත ජේ. ඩබ්ලිව්. මැතිව්/එස්. ඊ. සී./1159/94
සී. මැතිව් සහ කො. (පුද්ගලික) සමාගම.

09-371

---

## අදේශිත ඇටෝර්නි බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කුරුණෑගල, මිහිඳු මාවතෙහි අංක 15, දරන ස්ථානයෙහි පදිංචිව සිට දැනට ජපාන රාජ්‍යයේ, අංක 412/0023 ජැපෑන්හි, ෂිෂුඕකා, ගිටෙම්බා, සුකසාවා හි, අංක 1279 දරන ස්ථානයෙහි පදිංචිව සිටින (අංක ටීඑච් 4983080 දරන ජපන් ගමන් බලපත්‍රය හිමි) යොෂියුකි හයාෂි වන මා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, කුරුණෑගල, අලකොලදෙනිය පාර, නිර්මල පෙදෙසෙහි, අංක 261/7 දරන ස්ථානයෙහි පදිංචි අමිත් නානායක්කාර ලියනගේ වෙත ප්‍රදානය කරන ලද ප්‍රසිද්ධ නොතාරිස්, ඩබ්. සුදත් විජේවික්‍රම විසින් සහතික කරන ලද අංක 1243 සහ 2010.02.24 වැනි දින දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රය 2011.02.19 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨකර, බලරහිත කර, අවලංගු කරන ලද බවට පොදු මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

යොෂියුකි හයාෂි.

09-356

---

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

ජපන් විදේශ ගමන් බලපත්‍ර අංක T H 4983080 හිමි ජපන් රජයේ 412/0023 ශිසුඕකා ගිටෙම්බා, සුකසාවා හි අංක 1279 පදිංචි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කුරුණෑගල, මිහිඳු මාවතේ, අංක 15 දරන ස්ථානයේ කලින් පදිංචිව සිටි යොසියුකු හයාෂි වන මා මහජනතාවට මෙයින් දන්වන වග නම් කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් ගිලීෂියන් ජෝසප් සීසර් වීරසේකර පෙරේරා විසින් සහතික කොට කුරුණෑගල වඳුරාගල, කොළඹ පාරේ අංක 200 ස්ථානයේ මංගලසේන විජිත බණ්ඩාර රණරාජ වෙත 2011.01.25 වැනි දින අංක 944 මගින් මවිසින් පවරනු ලැබූ ඇටෝර්නි බලය 2011.01.25 වැනි දින සිට බලපවත්වන පරිදි ප්‍රත්‍යාදිෂ්ඨ කොට අවලංගු කරමි.

09-332

---

## ඇටෝර්නි බලය අහෝසි කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රාගම, කුරුකුලාවේ අංක 74/2 දරන ස්ථානයේ පදිංචි සේතුංග මුදලිගේ දෝන ශිරානි සේතුංග වන මම, ඉහත කී ශ්‍රී ලංකා ජනරජයේ පූගොඩ, ඕවිටිගම, මිල්ලගහවත්තේ අංක 117 ජේ දරන ස්ථානයේ පදිංචි (ජාතික හැ. ප. අංක 511381347V) දරන හෙට්ටිතන්ත්‍රිගේ ප්‍රේමසිරි ඇනිටන් ප්‍රනාන්දු යන අයට ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් රාජිත ප්‍රශාන්ති කුලතුංග මහත්මිය විසින් සහතික කරන ලද අංක 2079 හා 2010.08.09 වැනි දින දරන ඇටෝර්නි බලපත්‍රය මගින් දෙන ලද ඇටෝර්නි බලය මෙයින් අවලංගු කර අහෝසි කරමි.

ඉහත කී ඇටෝර්නි බලකරු විසින් ඉහත කී ඇටෝර්නි බලපත්‍රය ප්‍රකාරව මින් පසුව කරනු ලබන කිසිදු ක්‍රියාවක් සම්බන්ධයෙන් මා වගකීම් නොදරන බව මෙයින් දැනුම් දෙමි.

සේතුංග මුදලිගේ දෝන් ශීරානි.

2011 අගෝස්තු මස 24 වැනි දින.

09-305

---

## වගකීමෙන්, සීමිත සමාගමක් සංස්ථාපනය කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 09 වැනි ඡේදය යටතේ කරනු ලබන දැන්වීම

සමාගමේ නම : ජෙනරල් මර්චන්ටස් ඇන්ඩ් ට්‍රේඩර්ස් (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය හා දිනය : පී වී 79975
දිනය : 2011 ජූලි 11
සමාගමේ ලිපිනය : අංක 07, අසෝක මාවත, සිරිමල් උයන, රත්මලාන.

ක්‍රිෂ් විල්හෙල්ම් බල්තසාර්,
අධ්‍යක්ෂක.

09-353

---

## සංස්ථාගත කිරීම පිළිබඳ ප්‍රසිද්ධ නිවේදනය

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ නිවේදනය

සමාගමේ නම : වී වී එස් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 77930
සංස්ථාගත කිරීමේ දිනය : 2011 මාර්තු 25
ලියාපදිංචි කාර්යාලය : 262, අවිස්සාවේල්ල පාර, මහරගම.

චාර්ට් බිස්නස් සිස්ටමස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

09-358/3

### සමාගමේ නම වෙනස් කිරීම පිළිබඳ ප්‍රසිද්ධ නිවේදනය

පහත සඳහන් සමාගමේ නම 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (2) වගන්තියට අනුගාමීව 2011 ජුනි මස 21 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි වෙනස් කළ බව ( 8 වැනි වගන්තියට අනුව) මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ මීට ප්‍රථම නම : කැප්ලෝ ට්‍රේඩිං කම්පනි (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පීවී 77806
සමාගමේ ලිපිනය : අංක 112 සී, නාමලුව හන්දිය, කුඹුක පාර, කොතලාවල, බණ්ඩාරගම
සමාගමේ නව නාමය : ඉම්පීරියල් ට්‍රේඩිං කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්

චාට් බිස්නස් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

අංක 141/3, වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.

09-358/2

---

### නිවේදනයයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : එන්ටර්ට්‍රේනර්ස් ග්‍රෑප් ඇන්ඩ් පර්සනල් ෆිට්නස් සොලුෂන්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්.
ලියාපදිංචි අංකය : PV80583
ලියාපදිංචි කාර්යාලයීය ලිපිනය : 5/11, 27 ලොරිස් පෙදෙස.
ලියාපදිංචි කළ දිනය : 2011 අගෝස්තු 11

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

09-188

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9(1) වගන්තිය ප්‍රකාර මෙම සමාගම, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් ලියාපදිංචි කර ඇති බැව් මෙයින් දන්වමි.

සමාගමේ නම : බ්‍රිටිස් වේ ඉංග්ලිෂ් ඇකඩමි (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය සහ දිනය : පීවී 80122, 2011.07.19
ලියාපදිංචි ලිපිනය : අංක 2/36, නුවර පාර, නිට්ටඹුව.

සිතාරා මීමන,
සමාගම් ලේකම්.

2011 ක් වූ අගෝස්තු මස 24 වැනි දින,
අංක 59/6,
මඩුවේගෙදර, නිට්ටඹුව.

09-235

---

### ඇටෝර්නි බලය අවලංගු කිරීමයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නිට්ටඹුව, මීගමු පාර, අංක 212 දරන ස්ථානයේ පදිංචි මල්කා ගයානි රූපසිංහ වන මම මාගේ නිත්‍යානුකුල ඇටෝර්නි බලකරු ලෙස නිට්ටඹුව, මීගමු පාර, අංක 212 දරන ස්ථානයේ පදිංචි සකලවල්ලි ආචාරිගේ දීත් රවින්ද රූපසිංහ පත් කරමින් ලියන ලද ප්‍රසිද්ධ නොතාරිස් සිතාරා මීමන මහත්මිය විසින් සහතික කරන ලද අංක 724 සහ වර්ෂ 2007.08.01 වැනි දින දරන ඇටෝර්නි බලපත්‍රය අද පටන් අවලංගු කොට ප්‍රත්‍යාදිෂ්ඨ කරන බව උතුම් වූ ශ්‍රී ලංකා රජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

මල්කා ගයානි රූපසිංහ,
ඇටෝර්නි අධිපති.

09-234/1

---

### ඇටෝර්නි බලය අවලංගු කිරීමයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වැබඩ, ගෝනහේන අංක 308/6 දරන ස්ථානයේ පදිංචි නාරන්ගොඩ ලියනගේ සිරිල් වන මම මාගේ නිත්‍යානුකුල ඇටෝර්නි බලකරු ලෙස දෙල්ගොඩ, මීගහවත්ත, අංක 38/ඒ දරන ස්ථානයේ පදිංචි මුදන්නායකගේ රමණී ජයසේකර පත් කරමින් ලියන ලද ප්‍රසිද්ධ නොතාරිස් සිතාරා මීමන මහත්මිය විසින් සහතික කරන ලද අංක 1242 සහ වර්ෂ 2009.12.31 වැනි දින දරන ඇටෝර්නි බලපත්‍රය අද පටන් අවලංගු කොට ප්‍රත්‍යාදිෂ්ඨ කරන බව උතුම් වූ ශ්‍රී ලංකා රජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

නාරන්ගොඩ ලියනගේ සිරිල්,
ඇටෝර්නි අධිපති.

09-234/2

---

### මහජන දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනත ප්‍රකාරව සීෆාර් මැරින් සප්ලයිං ඇන්ඩ් ලොජිස්ටික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් (පෞද්ගලික) සීමිත වගකීම් සමාගමක් ලෙස 2010 ඔක්තෝබර් මස 29 වැනි දින සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : සීෆාර් මැරින් සප්ලයිං ඇන්ඩ් ලොජිස්ටික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පීවී 75196
ලියාපදිංචි ලිපිනය : අංක 50, සල්මල් පෙදෙස, මත්තේගොඩ

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

09-225

## නිවේදනය

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බව අපි මෙයින් නිවේදනය කර සිටිමු.

සමාගමේ නම : ඉකොනොමි ටැක්ෂි සර්විසස් (පීවීටී) එල්ටීඩී
සමාගම ලියාපදිංචි අංකය : පීවී 80577
සමාගම ලියාපදිංචි කළ කාර්යාලය : අංක 43, කොළඹ පාර, මීගමුව
සමාගම ලියාපදිංචි කළ දිනය : 2011.08.10

09-199/1

---

## නිවේදනය

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බව අපි මෙයින් නිවේදනය කර සිටිමු.

සමාගමේ නම : මාක් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : පී.වී. 80513
සමාගම ලියාපදිංචි කළ කාර්යාලය : අංක 236, ඉ 7, ටී. සී. පාර, කුඩාබුත්ගමුව, අංගොඩ.
සමාගම ලියාපදිංචි කළ දිනය : 2011.08.05

09-199/2

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ඩැප්නිඩොස් 27 කිබිස්ලි, ඇතැන්ස් ග්‍රීස් හි පදිංචි හේවාසිය සිංපොල්ගහමුල්ලගෙයි චන්ද්‍රානි නොහොත් චන්ද්‍රානි සියසිංහ (ජා. හැ. අංක 595190061V) වන මම ශ්‍රී ලංකා, මාතර, කඹුරුපිටිය, ලෙනබටුව, "පත්මානි" හි පදිංචි නිරෝෂ ධනුවන්ත ප්‍රනාන්දු යන අය වෙත ඇටෝර්නි බලය පවරන ලද 2005.03.03 වැනි දින ග්‍රීසියේ ගරු කොන්සල් නිකොලාස් ජී. පෙත්මසාස් සහතික කරන ලද ඇටෝර්නි බලපත්‍රයේ 299 කාණ්ඩයේ 71 පත්ඉරුවේ 5411 දරන දින පොත් අංකය යටතේ 2005.04.29 වැනි දින ලියාපදිංචි වී ඇති ඇටෝර්නි බලපත්‍රය අවලංගු කොට ප්‍රත්‍යාදිෂ්ඨ කළ බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත්, මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි. මින් ඉදිරියට එකී ඔහු විසින් මා වෙනුවෙන් කරනු ලබන කිසිම ගණුදෙනුවකට මා වගනොකියන බවද මින් දන්වා සිටිමි.

හේවාසිය සිංපොල්ගහමුල්ලගෙයි චන්ද්‍රානි
නොහොත් චන්ද්‍රානි සියසිංහ.

09-197

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) දරන ඡේදය යටතේ,

සමාගමේ නම : ප්‍රින්ටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී.වී. 79211
සංස්ථාගත කළ දිනය : 2011.06.07
කාර්යාලයේ ලියාපදිංචි කළ ලිපිනය : අංක 393, යුනියන් පෙදෙස, කොළඹ 02.

ලේකම්වරු.

09-196/2

---

## ඇටෝර්නි බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

නයිනමඩම, බස්නාහිර නයිනමඩම, අංක 69/A දරන තැන පදිංචි (ජා. හැ. පත් අංක 723070538v හිමි) මසෙව්ගේ රුවන් ප්‍රසාද් පර්ඩිනන්ඩ් ප්‍රානාන්දු සහ (ජා. හැ. පත් අංක 737400638v හිමි) වර්ණකුලසූරිය අලගප්පගේ ඇන් තුෂාරි ප්‍රදීපිකා ප්‍රනාන්දු වන අප විසින් නයිනමඩම, බස්නාහිර නයිනමඩම, "රසාංජි" හි පදිංචි (ජා. හැ. පත් අංක 591670212v හිමි) මසෙව්ගේ බැසිල් රංජිත් ප්‍රනාන්දු වෙත පවරන ලද, ඩබ්ලිව්. ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කල අංක 3003 සහ 2005.03.29 වැනි දින දරන ඇටෝර්නි බලපත්‍රය මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කොට අවලංගු කරනු ලබන බවත් මින් ඉදිරියට එම ඇටෝර්නි බලපත්‍රය මගින් කරනු ලබන කිසිදු කටයුත්තක් සම්බන්ධව අපගේ වගකීමක් නොමැති බවත් මෙයින් ප්‍රකාශ කරමු.

මසෙව්ගේ රුවන් ප්‍රසාද් පර්ඩිනන්ඩ් ප්‍රනාන්දු,
වර්ණකුලසූරිය අලගප්පගේ ඇන් තුෂාරි ප්‍රදීපිකා ප්‍රනාන්දු.

09-205

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් ආඥා පනත ප්‍රකාරව පහත සඳහන් සමාගම 2011 අගෝස්තු මස 16 වැනි දින සිට ලියාපදිංචි කර ඇත.

සමාගමේ නම :IML Lanka (Private) Limited
ලියාපදිංචි අංකය : PV80687
ලියාපදිංචි ලිපිනය : අංක 9/5, තම්බයියා ඇවනියු, කොළඹ 07.

ජේසී සහ සමාගම,
සමාගම් ලේකම්වරු,

අංක 9/5, තම්බයියා ඇවනියු,
කොළඹ 07.

09-211

---

## අංක 19340 සහ 2009.10.24 වැනි දින දරන ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

කහදමෝදර, රත්න හි පදිංචි හෙට්ටියාකන්දගේ මිචෙල් සම්පත් ප්‍රනාන්දු (ජා. හැ. ප. අංක : 801715435v) වන මම හම්බන්තොට දිස්ත්‍රික්කයේ, දකුණු ගිරුවා පත්තුවේ, රත්න, කහදමෝදර පිහිටි මයිලගහවත්ත නමැති ඉඩමේ බෙදා වෙන් කරන ලද කබැලි අංක 'ඒ' දරන අක්කර එකයි රූඩ් එකක (අ. 1, රූ. 1, පර්. 0) යුතු ඉඩම වෙනුවෙන් 2009.10.24 වැනි දිනැති අංක 19340 දරන ඇටෝර්නි බලපත්‍රයෙන් ගලකුඹගේ අනුරසිරි (ජා. හැ. ප. අංක 710110638v) යන අයට ලබාදුන් බලතල 2011.08.23 වැනි දින සිට අවලංගු කරන බැව් මහජනයා වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

හෙට්ටියාකන්දගේ මිචෙල් සම්පත් ප්‍රනාන්දු.

2011 අගෝස්තු මස 23 වැනි  දින දී ය.

09-214

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) දරන ඡේදය යටතේ,

සමාගමේ නම : ටෙස්ට් ලෑන්ඩ් රෙස්ටොරන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 79777
සංස්ථාගත කළ දිනය : 2011.07.04
කාර්යාලයේ ලියාපදිංචි කළ ලිපිනය : අංක 294, නුවර පාර, වේවැල්දෙනිය.

ලේකම්වරු.

09-196/1

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම 2011 අගෝස්තු මස 18 වැනි දින සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : වී. එම්. ප්‍රෝ ඩයිව් ලංකා (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පීවී 80724
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය :අංක 30/90S, මලලසේකර මාවත, කොළඹ 07

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

බිස්නස් සොලුෂන්ස් ඇන්ඩ් සෙකට්‍රීස් (පුද්ගලික) සමාගම.

09-176

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

මීගමුව, කිඹුලාපිටිය පාර, උතුරු කදිරාණ, ශ්‍රී ජිනවංශ නාහිමි මාවත, අංක 216/ඒ 14 හි පදිංචි පොත්තාගේ විජිත ප්‍රනාන්දු වන මා හට නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් සුදර්ශි රණතුංග විසින් 2011.02.16 වැනි දින සහතික කරන ලද අංක 838 දරන ඇටෝර්නි බලපත්‍රයෙන් කොච්චිකඩේ, ලූර්දු මාවත, අංක 8/එෆ් හි පදිංචි මාකවිටගේ රේමන් ලෙනාඩ් අප්පුහාමි මහතා විසින් පවරා දෙන ලද ඇටෝර්නි බලය අවලංගු කළ බව මෙයින් දන්වමි.

09-194

---

## සංස්ථාපනය කිරීම පිළිබඳ ප්‍රසිද්ධ නිවේදනය

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ නිවේදනය

සමාගමේ නම : එක්සෙලන්ට් අයිටී සොලුෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පීවී 77934
සංස්ථාගත කිරීමේ දිනය : 2011 මාර්තු 23
ලියාපදිංචි කාර්යාලය : අංක 464, තලවතුගොඩ පාර, මාදිවෙල, කෝට්ටේ.

සමාගම් ලේකම්වරු,
චාර්ට් බිස්නස් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

09-358/1

---

## දැන්වීමයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 09 දරන වගන්තිය ප්‍රකාරව සියෙල්කෝ ග්ලෝබල් (පීවීටී) එල්ටීඩී වර්ෂ 2011 ක් වූ අගෝස්තු මස 22 වැනි දින සංස්ථාපනය කරන ලද බවට කරනු ලබන දැනුම් දීමයි.

සමාගමේ නම : සියෙල්කෝ ග්ලෝබල් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : PV80789
ලියාපදිංචි කාර්යාලය : අංක 128 1/4 වැනි පටුමග, බලගල පාර, හැඳල, වත්තල

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන්,

සමාගම් ලේකම්.

09-333

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

කොළඹ 11, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්තුමා විසින් 1996.09.21 වැනි දින ලිඛිත බලධාරිකම් හා ඇටෝර්නි බලපත්‍ර පොතේ 339 වැනි කාණ්ඩයේ 81 වැනි පත්‍රිරුවේ, 12200 දින පොත් අංකය යටතේ 2006.09.21 වැනි දින ලියා පදිංචි කරන ලද්දාවූ සහ බොරලන්ද නුවරඑළිය පාර පදිංචි නීතිඥ ප්‍රසිද්ධ නොතාරිස් සහ දිවුරුම් කොමසාරිස් ර. මු. ඔබියස් සිංඥෝ මහතා විසින් 2006.06.28 වැනි දින ලියා සහතික කරන ලද අංක 341 දරන ඇටෝර්නි බලපත්‍රය අද දින සිට නිත්‍යානුකූලව අවලංගු කරන බව ශ්‍රී ලංකා රජයටත් මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි.

එම්. එම්. මහේන්ද්‍ර ස්වර්ණසිරි මාරසිංහ.

09-192

---

## ඇටර්නි බලය අවලංගු කිරීම

පහත අත්සන් කරන කොළඹ 03, ඇල්ෆ්‍රඩ් හවුස් පාර, අංක 8 හි පදිංචි දොස්තර චිත්‍රාදේවි යසෝදරා විජේසිංහ (ජාතික හැඳුනුම්පත් අංක 487462675v) වන මා විසින් කොළඹ 03, ඇල්ෆ්‍රඩ් හවුස් පාර, අංක 8 හි පදිංචි සැම්සන් සේන විජේසිංහ සහ මුක්තා විජේසිංහ වෙත ප්‍රදානය කරන ලද එම්. ඒ. ඇල්ලේපොල ප්‍රසිද්ධ නොතාරිස් විසින් වර්ෂ 1992 ජුලි මස 29 වැනි දින සහතික කරන ලද අංක 3445 දරන ඇටර්නි බලකරය සහ ඔවුන් වෙත ප්‍රදානය කර ඇති වෙනයම් හෝ ලියවිලි තිබේනම් ඒ සියලු බලකරයන් වර්ෂ 2011 ක්වූ අගෝස්තු මස දහවන (10) දින ප්‍රත්‍යාදිෂ්ඨ කොට අහෝසි කොට අවලංගු කරන ලද බව සහ එහෙයින් එකී ඇටර්නි බලයන් බල රහිත වන බව ද මහජනතාව වෙත දන්වා සිටී.

එකී සැම්සන් සේන විජේසිංහ සහ මුක්තා විජේසිංහ මින් ඉදිරියට මාගේ ඇටර්නි බලකරු නොවන බවත්, ඔහු විසින් කරනු ලබන කවර හෝ කාර්යයකට ගණුදෙනුවකට මා වග නොකියන බවත් ප්‍රකාශ කරමි.

දොස්තර චිත්‍රාදේවි යසෝදරා විජේසිංහ.

09-189

### ඇටර්නි බලය අවලංගු කිරීම

පහත අත්සන් කරන කොළඹ 03, ඇල්ෆ්‍රඩ් හවුස් පාර, අංක 8 හි පදිංචි දොස්තර සංජීව සමරකෝන් විජේසිංහ (ජාතික හැඳුනුම්පත් අංක 491140330v) වන මා විසින් කොළඹ 03, ඇල්ෆ්‍රඩ් හවුස් පාර, අංක 8 හි පදිංචි සැම්සන් සේන විජේසිංහ වෙත ප්‍රදානය කරන ලද මර්වින් සෙන්ට් සෙබස්ටියන් කාසි චෙට්ටි ප්‍රසිද්ධ නොතාරිස් විසින් වර්ෂ 1977 දෙසැම්බර් මස 20 වැනි දින සහතික කරන ලද අංක 2238 දරන ඇටර්නි බලකරය සහ ඔහු වෙත ප්‍රදානය කර ඇති වෙනයම් හෝ ලියවිලි තිබේනම් ඒ සියලු බලකරයන් වර්ෂ 2011 ක් වූ අගෝස්තු මස දහවන (10) දින ප්‍රත්‍යාදිෂ්ඨ කොට අහෝසි කොට අවලංගු කරන ලද බව සහ එහෙයින් එකී ඇටර්නි බලයන් බල රහිත වන බව ද මහජනතාව වෙත දන්වා සිටී.

එකී සැම්සන් සේන විජේසිංහ මින් ඉදිරියට මාගේ ඇටර්නි බලකරු නොවන බවත්, ඔහු විසින් කරනු ලබන කවර හෝ කාර්යයකට ගණුදෙනුවකට මා වග නොකියන බවත් ප්‍රකාශ කරමි.

දොස්තර සංජීව සමරකෝන් විජේසිංහ.

09-190

---

### සමාගමක් සංස්ථාගත කිරීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන නිවේදනය

සමාගමේ නම : ස්ටෑන් ඩයග්නෝටික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සංස්ථාගත කළ දිනය : 2011.06.02
ලියාපදිංචි අංකය : PV79154
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 364, පිළපිටිය, කැළණිය.

කේ. ඒ. ඒ. අසංක පෙරේරා,
සමාගම් ලේකම්.

09-208

---

### සමාගමක් සංස්ථාගත කිරීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි

සමාගමේ නම : ස්මාර්ට් ටැක්සි (ප්‍රයිවට්) ලිමිටඩ්
සංස්ථාගත කළ දිනය : 2011.07.18
ලියාපදිංචි අංකය : PV80067
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 63, 2/3, නුවර පාර, කිරිබත්ගොඩ.

ජේ. එම්. ඩී. ආරියරත්න,
(වරලත් ගණකාධිකාරි),
සමාගම් ලේකම්.

09-207

---

### සමාගමක් සංස්ථාගත කිරීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි

සමාගමේ නම : සමගි ෆුඩ් ප්‍රඩක්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සංස්ථාගත කළ දිනය : 2011.07.13
ලියාපදිංචි අංකය : PV80034
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : නැදුරන පාර, ඇහැලියගොඩ.

යූ. කේ. එච්. ඩී. වීරසිංහ,
සමාගම් ලේකම්,

09-206

---

# රටබීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම්පත්

## කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

විදේශීය මත්පැන් තැබෑරුම් රේන්ද නැවත විකිණීම - 2012 වර්ෂය

1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කර ඇති 1983 වර්ෂයට හා ඊට පසු කාල පරිච්ඡේදයන් සඳහා වලංගු රා තැබෑරුම් හා විදේශීය මත්පැන් (ධාන්‍යවලින් මෙරට නිපදවන බීම වර්ග ඇතුළුව) තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසිවලටත්, එම කාලය තුළ දී පවත්නා සෑම සුරාබදු කොන්දේසිවලටත් යටත්ව, 2012 වර්ෂය තුළ දී පහත සඳහන් උපලේඛනයන්හි දැක්වෙන අංක 2 පුඩළුඔය විදේශ මත්පැන් තැබෑරුම (ධාන්‍යවලින් මෙරට නිපදවන බීම වර්ග ඇතුළුව) සිල්ලරට විකිණීමේ තනි අයිතිය මිල දී ගැනීම සඳහා කොත්මලේ ප්‍රාදේශීය ලේකම් විසින් 2011.10.06 වැනි දින පහත සඳහන් උපලේඛනයන් හි දැක්වෙන වේලාව දක්වා රේන්ද නැවත විකිණීම සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. (අ) සෑම ටෙන්ඩරයක්ම දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් පෝරමය විය යුතු ය.

(ආ) ටෙන්ඩර් මුදලක් වශයෙන් ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක පහත උපලේඛනයේ දැක්වෙන ආකාර ටෙන්ඩර් මුදලක් තැන්පත් කර ලබා ගන්නා ලද නිල කුවිතාන්සියක් ; සහ

(ඇ) ටෙන්ඩර්කරුගේ ඉඩකඩම් ආදී නිශ්චල දේපළ පිහිටි කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබාගන්නා ලද වත්කම් පිළිබඳ සහතිකයක් ටෙන්ඩරය සමග ඉදිරිපත් කළ යුතු ය. ටෙන්ඩර් සහ වත්කම් සහතික ඉදිරිපත් කිරීම පිළිබඳව යථොක්ත රා තැබෑරුම් විකිණීමේ කොන්දේසිවල සහ විදේශීය මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසිවල අඩංගු නියමයන් විධිමත් ලෙස පිළිපැදිය යුතු බව ටෙන්ඩර්කරුවන් වෙත නිවේදනය කෙරේ.

(ඈ) ටෙන්ඩර්පත්‍ර සම්පූර්ණ කිරීමේ දී පහත සඳහන් අවශ්‍යතාවයන් කෙරෙහි ද සැලකිලිමත් විය යුතු ය :

(i) ටෙන්ඩර්පත්‍ර මුලුමනින්ම සම්පූර්ණ කළ යුතු ය. මෙසේ කිරීමේ දී එහි සඳහන් කෙරෙන ගණන ඉලක්කමෙන් පමණක් නොව අකුරෙන් ද ලිවිය යුතු ය.

(ii) සම්පූර්ණ කරන ලද ටෙන්ඩර්පත්‍රවල නියමිත සාක්ෂිකරුවන්ගේ සාක්ෂිවලට අමතරව පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ හැඳුනුම්පත් අංක ද යෙදිය යුතු ය.

(iii) සෑම වෙනස් කිරීමක්/කපා හැරීමක් ටෙන්ඩර්කරුගේ සම්පූර්ණ අත්සන හා දිනය යෙදීමෙන් සහතික කළ යුතු ය.

(iv) සෑම සාර්ථක ටෙන්ඩර්කරුවෙකුම ටෙන්ඩර් පෝර්මය සමග තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතුය. මෙම නියමයන්ට පටහැනි ටෙන්ඩර්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පත්‍රය ටෙන්ඩර් තැන්පත් මුදල සඳහා ලබා ගන්නා ලද නිල කුවිතාන්සියක්, වත්කම් පිළිබඳ සහතිකයේ මුල් පිටපත (යම් දිසාපතිවරයෙක් වත්කම් සහතිකයේ මුල් පිටපත රඳවා ගෙන සිටින අවස්ථාවක දී සහතික කළ පිටපතක් ඉදිරිපත් කළ හැකිය.) සමග ලියුම් කවරයක බහා මුද්‍රා තබා කවරයේ වම් පස ඉහළ කෙළවරේ නියමිත තැබෑරුම් අංකය සහ නම සඳහන් කර කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ, ටෙන්ඩර් භාර ගැනීම අවසන් වීමට පෙර තැන්පත් කළ යුතු ය. ටෙන්ඩර් පත්‍රය තැපෑලෙන් එවන්නේ නම්, ටෙන්ඩර් භාර ගැනීමේ වේලාව ඉකුත් වීමට පෙර "ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කොත්මලේ" යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි සීඝ්‍රගාමී තැපෑලෙන් එවිය යුතු ය.

04. ටෙන්ඩර් භාර ගැනීමේ අවසන් වේලාව පහත උපලේඛනයේ දැක්වේ. එකී වේලාවට ටෙන්ඩර්කරුවන් කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

05. ඕනෑම ටෙන්ඩරයක් භාර ගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය මා සතුය.

06. තෝරාගත් ටෙන්ඩර්කරු, ගැණුම්කරු ලෙස ප්‍රකාශයට පත් කළ වහාම එදින ප. ව. 2.00ට පෙර ඇප තැන්පත් මුදල වශයෙන් කොත්මලේ ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලැබිය හැකි වාරික තුනකට නොඅඩු මුදලක් ඇප තැන්පත් වශයෙන් කොත්මලේ ප්‍රාදේශීය ලේකම් වෙත තැන්පත් කළ යුතු ය. එම මුළු මුදල මා නමින් පුඩලූඔය මහජන බැංකුවේ වර්ෂයක ස්ථාවර තැන්පත් ගිණුමක රඳවා තැබීමට රේන්දකරුවන් එකඟ විය යුතු ය. මෙම තැන්පතුව මුදලින් හෝ බැංකුවක් විසින් ගෙවීම සඳහා ද යන්න සඳහන් කරන ලද චෙක් පතකින් හෝ ලංකා බැංකුවෙන් හෝ මහජන බැංකුවෙන් ආරක්ෂිත චෙක්පත් ස්වරූපයෙන් ගෙවිය යුතු ය.

අවශ්‍ය මුද්දර ආදිය ඉදිරිපත් කොට කොන්දේසි මාලාවට සහ කොන්ත්‍රාත්තුවට ටෙන්ඩර්කරු අත්සන් තැබිය යුතු ය.

07. පොරොන්දු වන ටෙන්ඩර් මුදල වාරික වශයෙන් මුදලින් පමණක් ගෙවිය හැකි අය ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතු ය.

08. කිසියම් ටෙන්ඩරයක් කිහිප දෙනෙකු විසින් හවුලේ ඉදිරිපත් කරනු ලබන්නේ නම්, ඒ එක් එක් අයවලුන්ගේ පෞද්ගලික ලිපිනයන් වෙන වෙනම පැහැදිලිව දැක්විය යුතු ය.

09. මෙම ටෙන්ඩර් විකිණීම සම්බන්ධයෙන් මාගේ තීරණය අවසාන තීරණය වේ.

10. රේන්ද විකිණීම හා අදාළ කොන්දේසි සහ වෙනත් වැඩි විස්තර කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් විමසා ලබා ගත හැකිය.

එච්. එම්. එම්. යූ. බී. හේරත්,
ප්‍රාදේශීය ලේකම්.
කොත්මලේ.

2011 අගෝස්තු මස 23 වැනි දින,
කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

උපලේඛනය

| අංකය හා රා තැබෑරුමේ නම | තැබෑරුම පිහිටි ස්ථානය | ටෙන්ඩර් භාරගැනීම අවසන් වන වේලාව | ටෙන්ඩර් තැන්පත් මුදල (රු.) |
|---|---|---|---|
| අංක 02 විදේශ මත්පැන් තැබෑරුම පුණ්ඩළුඔය | පුණ්ඩළුඔය නගරය ඉහල කඩවීදිය | 2011.10.06 පෙ. ව. 10.30 | 3,000 |

09-368

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

SEY 15 - 11

## සෙලාන් බැංකුව පීඑල්සී - බොරලැස්ගමුව ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, තල්පේ පත්තුවේ, පිලානේ පිහිටි බලයලත් මිනින්දෝරු කේ. පී. සමරසේකර විසින් මැන සාදන ලද 1998.03.16 දිනැති අංක 350 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන උඩවත්ත හෙවත් ඉඳුරුගේවත්ත නමැති ඉඩමේ ලොට් ඒ ලෙස ලකුණු කළ බෙදා වෙන් කරන ලද පර්චස් පහලොවක් (අ. 0, රූ. 0, පර්. 15) විශාල ඉඩම සහ ගොඩනැගිලි ගස් වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේත්.

මෙම දේපල මහරගම ඩබ්ලිව්. ජේ. 8064 දරන ව්‍යාපාර ලියාපදිංචි අංකය යටතේ මෙසස් ඩබ්ලිව්. වී. එස්. මාකටිං යන නාමය සහ විලාශය සහ අභිධානය යටතේ හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යන මහරගම පදිංචි වලවේ විතානගේ ශාන්ත සහ වලවේ විතානගේ සුනිල් යන අය බන්ධනදායීන් වශයෙන් සෙලාන් බැන්ක් පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

ඉහත සඳහන් දේපල වර්ෂ 2011 ක් වූ සැප්තැම්බර් මස 27 වැනි දින පෙ.ව. 9.30 ට එම දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ප්‍රවේශය*.- පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් නඩත්තු කරනු ලබන ගාල්ල - දෙනියාය ප්‍රධාන මාර්ගයට මායිම්ව පිලාන නමැති ගමේ පිහිටා ඇති මෙම නිවාසය සහිත ඉඩමට ඉතා පහසුවෙන් ළඟා විය හැකිය.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2010.11.13 වැනි දින ඩේලි මිරර් සහ ලංකාදීප පුවත්පත් ද 2010.11.23 දිනැති තිනක්කුරල් පුවත්පතද 2010.11.19 දිනැති ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය ද බලන්න.

*ගෙවීමේ ක්‍රමය*.- වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

(1) ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද, (2) පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් සියයට එකක් (1%) ක්ද (3) වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%) ක් ද (4) විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදාහක් (රු. 2,000) ක් ද, (5) ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් පන්සීය (රු.500) ක් ද (6) සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනුවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවිය යුතුය.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : ප්‍රධාන කළමනාකරු (නීති දෙපාර්තමේන්තුව), සෙලාන් බැංකුව පීඑල්සී අංක 90, ගාලු පාර, කොළඹ 03. (දුරකථන අංකය : 011-2456480, 2456458)

පියරත්න මුතුකුමාරණ,
(මුළු දිවයිනටම සාම විනිසුරු),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු
හා බලයලත් වෙන්දේසිකරු.

අංක 156- 1/13,
උසාවිය පාර,
කොළඹ 12,
දුරකථන අංක : 0777-378441,
0714-424478,
ෆැක්ස් අංකය : 0112-345975.

09-224

---

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී -ගල්කිස්ස ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් බී. ඩී. ටී. ධර්මතිලක විසින් සහතික කරන ලද්දා වූ ද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී නමට ලියන ලද්දා වූ ද 2005.02.18 දිනැති සහ අංක 1185 දරන බැඳුම්කරය යටතේ අය විය යුතු මුදල් ගෙවීම අගුරු කංකානම්ගේ නරෙන්සි ජිනදාස යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින්,

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුලුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපල එම දේපල පිහිටි ස්ථානයේ දී 2011 ක් වූ සැප්තැම්බර් මස 26 වැනි දින පෙ.ව. 9.30 ට එම දේපල පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපල* .- බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ දෙහිවල ගල්කිස්ස මහ නගර සභා සීමාවේ කොට්ඨාස අංක 22 හි ටෙම්පල්ර්ස් පාරේ වරිපනම් අංක 59 හි කහටගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. බී. අබේසිංහ විසින් 2004.12.06 වැනි දිනැති අංක 1159 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් බී ලෙස සලකුණු කළ ඉඩම සහ එහි ඇති ගොඩනැගිලි සහ සියලු දේත් වේ. විශාලත්වය පර්චස් 15.02

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය. සඳහා 2010.10.29 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* හා 2011.08.12 දින ලක්බිම, ඩේලි මිරර් සහ තිනකරන් පුවත්පත් ද බලන්න.

*ඉඩමට පිවිසීම*.- ගල්කිස්ස මංසන්ධිය සිට (කොළඹ කොටුවේ සිට ගාලු පාරේ කිලෝමීටර් 12 ක් පමණ) ගාලු පාරේ රත්මලාන දෙසට මීටර් 100 ක් පමණ ගමන් කර වමට ඇති ටෙම්ප්ලර්ස් පාරට හැරී, මීටර් 300 පමණ ගියවිට පාරට යාබදව මේ ඉඩම වම් පැත්තේ දිස්වේ.

*ගෙවීමේ ක්‍රමය*.- වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය :–

1. ගැණුම් මුදලින් සියයට දහය (10%) ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%) ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%) ක් ද,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදාහක් (රු.2000) ක් ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් පන්සීය (රු.500) ක් ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනූවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ගෙවිය යුතු ය. දින 30 ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) මුදල අහිමි කිරීමට සහ දේපල නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාල ඔප්පු සහ ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ජොෂ්ඨ කළමණාකරු (ණය අධීක්ෂණ සහ අය කිරීම්) හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී, අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

(දුරකථන අංකය 2661826, 2661835) ගෙන් ලබා ගත හැක.

පියරත්න මුතුකුමාරණ,
(මුළු දිවයිනටම සාම විනිසුරු),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු
හා බලයලත් වෙන්දේසිකරු.

අංක 156- 1/13,
උසාවිය පාර,
කොළඹ 12,
දුරකථන අංක : 0777-378441
0714-424478
ෆැක්ස් අංකය : 0112-345975.

09-223

## සීමාසහිත ඩී එෆ් සී සී වර්ධන බැංකුව

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 9 වැනි වගන්තිය යටතේ වටිනා දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

අංක 25240 දරන උකස්කරය යටතේ උකස් කරන ලද දේපල පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, මැද පත්තුවේ, ගම්පහ අලුත්ගම පිහිටි, මොරුපොල එස්ටේට් ලෙස හැඳින්වෙන, බලයලත් මිනින්දෝරු ඩබ්. එම්. පෙරේරා විසින් සාදන ලද, 1974 නොවැම්බර් මස 30 වැනි දිනැති අංක 1421 දරන පිඹුරේ ලොට් අංක 180 ලෙස දැක්වෙන සීමා නිර්ණය කර බෙදා වෙන් කරන ලද බිම් කට්ටිය ඉඩමේ ප්‍රමාණය : අක් 0, රූඩ්. 0, පර්. 20.5 එහි පිහිටි ගස්වැල්, වගාවන් සහ සියල්ල සහිතව, ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එම්. ඒ. එන්. ඩබ්. රාජකරුණා විසින් සහතික කරන ලද, 2007 සැප්තැම්බර් මස 05 වැනි දිනැති අංක 25240 දරන උකස්කරය ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ නීතිගත වූ, ලියාපදිංචි අංක N (PVS) 47335 දරන සහ ලියාපදිංචි කාර්යාලය අංක 315, කොළඹ පාර, ගම්පහ යන ස්ථානයේ පිහිටි (මින්මතු ආයතනය ලෙස හැඳින්වෙන) සෙනෙවි ට්‍රේඩර්ස් ඉන්ටර්නැෂනල් ප්‍රයිවට් ලිමිටඩ් විසින් සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුවට උකස් කරන ලදු ව, ගෙවීම්වල දී පොරොන්දු නිසියාකාරව ඉෂ්ට නොකරන ලද දේපළ, සීමාසහිත ඩී එෆ් සී සී වර්ධන බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2011 සැප්තැම්බර් මස 27 වැනි දින (අඟහරුවාදා) පෙ.ව. 11.00 පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය*.- මිළ තීන්දු වූ වහා ම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% ක් (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල ගැණුම් මිලෙන් 2 1/2% ක (සියයට දෙකහමාර),
4. රු.66,000 ක් වන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2000.

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පණවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අය බදු හෝ ගාස්තු අය කිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

වැඩි විස්තර සඳහා කරුණාකර ඩීඑෆ්සීසී බැංකුවේ නීති දෙපාර්තමේන්තුව අමතන්න : දුරකථන අංක 011-2442442

"ඉහත වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුය."

ෂොක්මන් සහ සමරවික්‍රම,
රජයේ අනුමැතිය ලත්, සියවසකට
අධික කලක් ශ්‍රී ලංකාවේ පිළිගත්,
පුරෝගාමී වරලත් වෙන්දේසිකරුවෝ,
තක්සේරුකරුවෝ සහ දේපළ එජන්තවරු.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය : 081-2227593,
දුරකථන අංකය/ෆැක්ස් අංකය : 081-2224371
ඊ-මේල් :schokmankandy@sltnet.lk

*නාගරික කාර්යාලය සහ ප්‍රදර්ශනාගාරය:*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05,
දුරකථන අංකය : 011-2502680, 2585408,
දුරකථන ෆැක්ස් අංකය : 011-2588176
ඊ-මේල් : schokman@samera 1892.com

වෙබ් අඩවිය :www.schokmanandsamerawickreme.com.

09-324

---

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - කොට්ටාව ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජී. එන්. බී. පෙරේරා විසින් සහතික කරන ලද්දා වූ ද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී නමට ලියන ලද්දා වූ ද 2010.06.29 දිනැති සහ අංක 5875 දරන බැඳුම්කරය යටතේ අය විය යුතු මුදල් ගෙවීම කපිල අසන්ත කුමාරසිරි මාතරගේ යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින්, හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපල එම දේපල පිහිටි ස්ථානයේ දී 2011 ක් වූ සැප්තැම්බර් මස 26 වැනි දින පෙ.ව. 11.00 ට එම දේපල පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපල .-* බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරළේ පල්ලේ පත්තුවේ හෝමාගම කීනගහලන්ද නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. ජේ. නානායක්කාර විසින් මැන සාදන ලද 1961.06.28 වැනි දිනැති අංක 680 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් 22 ලෙස සලකුණු කළ ඉඩම සහ එහි ඇති ගොඩනැගිලි සහ සියලු දේත් වේ. විශාලත්වය පර්චස් 20.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2011.08.19 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* හා 2011.08.16 වැනි දින ලක්බිම, ඩේලි මිරර් සහ තිනකරන් පුවත්පත් ද බලන්න.

*ඉඩමට පිවිසීම.-* හෝමාගම නගරයේ සිට අවිස්සාවේල්ල පාරේ, සම්පත් බැංකුව දක්වා මීටර් 100 ක් පමණ ගොස් එතැනින් වමට හැරී, මීටර් 50 ක් පමණ පළමු පටුමගේ ගමන් කළවිට අදාල දේපලට ළඟාවිය හැක. එය මේ පාරේ දකුණත පැත්තේ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය :-

1. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%) ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%) ක් ද,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදාහක් (රු.2000) ක් ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් පන්සීය (රු.500) ක් ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනූවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ගෙවිය යුතු ය. දින 30 ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) මුදල අහිමි කිරීමට සහ දේපල නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාල ඔප්පු හා ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමණාකරු (ණය අධීක්ෂණ සහ අයකිරීම්) හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී, අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10. (දුරකථන අංකය 2661826, 2661835) ගෙන් ලබා ගත හැක.

පියරත්න මුතුකුමාරණ,
(මුළු දිවයිනටම සාම විනිසුරු),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා
බලයලත් වෙන්දේසිකරු.

අංක 156 - 1/13,
උසාවිය පාර,
කොළඹ 12.
දුරකථන අංක : 0777-378441
0714-424478
ෆැක්ස් අංකය : 0112-345975.

09-299

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

කේ. එම්. පී. හේරත්
ගිණුම් අංක : 0023 5002 3057

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2008 අප්‍රේල් මස 30 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතියට අනුව බැඳුම්කර අංක 15386 ප්‍රකාර රුපියල් පන් ලක්ෂ නම දහස් තුන්සිය එකයි ශත අසූ අටක (රු.509,301.88) මුදලක් 2008 ජනවාරි මස 01 වැනි දින සිට බැඳුම්කර අංක 15386 මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හාර ලක්ෂ අනූ දෙදහස් තුන්සිය හතයි ශත දාහතක (රු.492,307.17) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහඅටක් (18%) බැගින් පොලිය ද, හා ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදුවූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ හා පරිශ්‍රයන් 2009.07.31 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ,* 2009.07.27 දින "දිවයින", "අයිලන්ඩ්" සහ "තිනකුරල්" දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි 2011.09.27 වැනි දින පෙ.ව. 11.30 ට පිහිටි ස්ථානයේ දී මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය යන අය විසින්, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, උතුරු පිටිගල් කෝරලේ යගම්පත්තුවේ, ගල්මුරුව පිහිටි "පොතුකොළවේවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඒ. ඒ. විමලසේන යන අය විසින් සාදන ලද 1999 නොවැම්බර් 10 දාතම හා අංක 2116 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන්කොට සීමා නිර්ණය කොට ලොට් 3 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : එකී පිඹුරේ ලොට් 2 නැගෙනහිරට: පිඹුරු අංක 2427 හි ලොට් 87, ප්‍රාදේශීය සභා පාරේ සිට අඩි 15 පළල පාර දකුණට : පිඹුරු අංක 2427 හි ලොට් 39 සහ බස්නාහිරට : පිඹුරු අංක 2427 හි ලොට් 04 සහ 05 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් හතක් (අක්. 0, රූ. 1, පර්. 7) විශාල ඉඩම් කොටස සමග පස ගහකොළ වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ හා මාර්ග අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් ද, වෙනත් අයිතීන් ද ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී පිඹුරු අංක 2427 හි ලොට් 87 වශයෙන් ලකුණුකොට ඇති ප්‍රාදේශීය සභා පාරේ සිට දිවෙන අඩි 15 පළල පාර භාවිතා කිරීමට හා නඩත්තු කිරීමට අයිතිය සහ නිදහස ද සමග වෙළුම/පත්ඉරුව ආර් 29/274 හි හලාවත ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

09-357/1

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

පී. එච්. සරත් සහ කේ. ඒ. අයි. ඩී. විජේරත්න
ගිණුම් අංක : 0060 5000 1871

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2009 ක් වූ ඔක්තෝබර් මස 29 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් හතලිස් හත් ලක්ෂ පනස් හය දහස් එකසිය පනස් පහයි ශත හැට හතරක (රු.47,56,155.64) මුදල ද 2009 අප්‍රේල් මස 17 වැනි දින සිට අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් විසි අට ලක්ෂ තිස් හය දහස් තුන්සිය පනස් එකයි ශත හැත්තෑ අටක (රු.28,36,351.78) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විසි පහක් (25%) හා තවත් රුපියල් දහ තුන් ලක්ෂ අනූ තුන් දහස් පන්සියයක (රු.13,93,500) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහඅටක් (18%) බැගින් වූ පොලිය ද, හා ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදුවූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ හා පරිශ්‍රයන් 2009.12.11 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ,* 2009.12.07 වැනි දින "දිවයින", "අයිලන්ඩ්" සහ "තිනකුරල්" දිනපතා ප්‍රවෘත්තිපත්‍ර වල පළකොට ඇති පරිදි 2011.09.28 වැනි දින පෙ.ව. 10.30 සහ පෙ.ව. 11.30 ට පිහිටි ස්ථානයේදී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින්, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරලේ, අධිකාරි පත්තුවේ, බියගම ප්‍රාදේශීය සභා සීමාවන් තුළ (මාකොළ උප කාර්යාලය) මාකොළ උතුර ග්‍රාමයේ පිහිටි මාවරමණ්ඩිය පාරේ වරිපනම් අංක 571 දරන පරිශ්‍රයන් හි "ගොරකගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩී. සී. එම්. එස්. විමලරත්න යන අය විසින් සාදන ලද 2006 මැයි 07 දාතම හා අංක 149/2006 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන්කොට සීමා නිර්ණය කොට ලොට් 1 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : කරුණාරත්නගේ ඉඩම සහ එම්. දොඩන්ගොඩගේ ඉඩම නැගෙනහිරට : පී. සී. පෙරේරා සහ වෙනත් අයගේ ඉඩම සහ ඥානවතී පෙරේරා යන අයගේ ඉඩම දකුණට : උඩුපිල පාර සහ එම්. දොඩන්ගොඩ යන අයගේ ඉඩම සහ බස්නාහිරට : කේ. කුසුමාවතී පෙරේරා, ප්‍රීත් සුසන්ත, එම්. දොඩන්ගොඩ, ඩබ්ලිව්. ඒ. ගුණසේකර සහ කුමාරි යාපා යන අයගේ ඉඩම් යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තිස් පහක් (අක්. 0, රූ. 0, පර්. 35) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන්ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග අංක. 149/2006 දරන එකී පිඹුරට අනුවය.

අංක 149/2006 දරන පිඹුරේ නිරූපිත ලොට් 1 පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි.

එකී මාකොළ උතුර ග්‍රාමයේ පිහිටි "ගොරකගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එස්. ධර්මවර්ධන යන අය විසින් සාදන ලද 1982 සැප්තැම්බර් 30 දාතම හා අංක 1329 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන්කොට සීමා නිර්ණය කොට ලොට් ඒ වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : කොඩිප්පිලි ආරච්චිගේ මුදලිහාමි සහ වෙනත් අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම නැගෙනහිරට : ලොට් බී දකුණට : ප්‍රධාන පාර සහ බස්නාහිරට : හෙයියන්තුඩුවගේ මොහොට්ටි පෙරේරා යන අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම සහ මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් පහක් (අක්. 0, රූ. 1, පර්. 5) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ අංක 1329 දරන එකී පිඹුරට අනුව වෙළුම/පත් ඉරුව සී 794/16 හි ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

බලයලත් මානක තැන ඩී. සී. එම්. එස්. විමලරත්න යන අය විසින් සාදන ලද 2006 මැයි 07 දාතම හා අංක 149/2006 දරන පිඹුරේ මාර්ග අයිතීන් ද සමගය.

අංක 325 දරන උකස් බැඳුම්කරය ප්‍රකාර හා ඒ යටතේ උකස් කොට ඇප කොට ඇත.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ පිහිටි මාවරමණ්ඩිය පාරේ වරිපනම් අංක 691/29 දරන "දෙල්ගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එම්. ඩබ්ලිව්. තෙපුලන්ගල යන අය විසින් සාදන ලද 2003 ජනවාරි 24 දාතම හා අංක 1522 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන්කොට සීමා නිර්ණයකොට ලොට් ඒ 7 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : එම ඉඩමේ කොටසක් සහ ලොට් ඒ 9 නැගෙනහිරට : ලොට් ඒ 9 දකුණට : ලොට් ඒ 8 සහ ඒ 6 සහ බස්නාහිරට : ජී. ඩී. රණසිංහ ගේ ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් නමයයි දශම අටයි බිංදුවක් (අක්. 0, රූ. 0, පර්. 9.80) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රචශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග අංක 1522 දරන එකී පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව සී 517/277 හි ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

බලයලත් මානක තැන එම්. ඩබ්ලිව්. තෙපුලංගල විසින් සාදන ලද 2003 ජනවාරි 24 දාතම හා අංක 1522 දරන පිඹුරේ ලොට් ඒ 8 මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමගය.

අංක 981 දරන උකස් බැඳුම්කරය ප්‍රකාර හා ඒ යටතේ උකස් කොට ඇප කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

09- 357/2

## සෙලාන් බැංකුව පීඑල්සී - ත්‍රිකුණාමලය ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීම (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ විකිණීම

මෙම දේපල ත්‍රිකුණාමලය පදිංචි සබුර්දීන් මොහමඩ් අලි යන අය බන්ධනදායීන් වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

1. නැගෙනහිර පළාතේ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, තම්පලාගාමම් පත්තුවේ, කින්නියා ප්‍රාදේශීය ලේකම්ගේ කොට්ඨාසයේ කින්නියා ප්‍රාදේශීය සභා සීමාව තුළ සින්නකින්නියා පිහිටි බලයලත් මිනින්දෝරු සහ තලම්තිකරු කේ. සෙල්ලපිල්ලේ විසින් අඳින ලද 1998.12.17 දිනැති අංක 1005 දරන සැලැස්මේ සඳහන් කින්නියාතෝට්ටම් නමැති ඉඩමේ ලොට් 01 ලෙස පෙන්නුම් කරනු ලබන බෙදා වෙන්කරන ලද ඉඩම සහ පරිශ්‍රය තුල පර්චස් විසි අටයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 28.5) විශාල ඉඩම. මෙය ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරුව ඞී 67/159 හි යථා පරිදි ලියාපදිංචි කර තිබුණි.

(ඉහත සඳහන් ඉඩම් කොටස සහ පරිශ්‍රය මෑතක මනින ලද අතර ත්‍රිකුණාමලය බලයලත් මිනින්දෝරු සහ තලම්තිකරු කේ. සෙල්ලපිල්ලේ විසින් අඳින ලද 2005.05.05 දිනැති අංක 4340 දරන සැලැස්මේ සඳහන් ලොට් 2 පෙර කී පරිදි පිහිටි මඩකලපුව පාර දිගේ වරිපනම් අංක 124ඒ/1 දරමින් පෙන්නුම් කර ප්‍රමාණය පර්චස් විසි අටයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 28.5) ලෙස දක්වන ලදී.

2. නැගෙනහිර පළාතේ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, තම්පලගාමම් පත්තුවේ, කින්නියා ප්‍රාදේශීය ලේකම්ගේ කොට්ඨාසයේ කින්නියා ප්‍රාදේශීය සභා සීමාව තුළ සින්නකින්නියා පිහිටි බලයලත් මිනින්දෝරු සහ තලම්තිකරු කේ. සෙල්ලපිල්ලේ විසින් අඳින ලද 1998.12.17 දිනැති අංක 1005 දරන සැලැස්මේ සඳහන් කින්නියාතෝට්ටම් නමැති ඉඩමේ ලොට් 02 ලෙස පෙන්නුම් කරනු ලබන බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසෙහි සහ පරිශ්‍රයෙන් බෙදූ කොටස තුළ උතුරේ සිට දකුණට බඹ 2 ක් සහ නැගෙනහිරට සිට බස්නාහිරට බඹ 15 ක් එනම් පර්චස් හතරක් (අ. 0, රූ. 0, පර්. 4) විශාල ඉඩම. මෙය ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරුව ඞී 73/161 හි යථා පරිදි ලියාපදිංචි කර තිබුණි.

(ඉහත සඳහන් ඉඩම් කොටස සහ පරිශ්‍රය මනින ලද අතර ත්‍රිකුණාමලය බලයලත් මිනින්දෝරු සහ තලම්තිකරු කේ. සෙල්ලපිල්ලේ විසින් අඳින ලද 2005.05.05 දිනැති අංක 4340 දරන සැලැස්මේ සඳහන් ලොට් 3 ලෙස පෙන්නුම් කරන ප්‍රමාණය පර්චස් හතරක් (අ. 0, රූ.0, පර්. 4) ක් වශයෙන් දක්වන ලදි.

3. නැගෙනහිර පළාතේ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, තම්පලාගම පත්තුවේ, කින්නියා ප්‍රාදේශීය සභා සීමාව තුළ කින්නියා සහකාර ආණ්ඩුවේ ඒජන්තගේ කොට්ඨාසයේ, සින්නකින්නියා පිහිටි කින්නියාතෝට්ටම් නමැති ඉඩම් කොටස් ගිණිකොණ කොටසින් අක්කර බාගේ කොටසින් (අක් 1/2)

එකී බෙදන ලද කොටසෙහි නැගෙනහිර මායිම් දිශාවට බෙදන ලද කොටස ප්‍රමාණය අක්කර කාලක් වේ. මෙය එයට අදාළ සියළු දේ සමග වන අතර නැගෙනහිරට දිශාවට බෙදන ලද කොටසින් උතුරු දිශාවට බෙදන ලද පෙර කී පරිදි පිහිටි ඉඩම් කොටසට මායිම්, උතුරට : යූසුප්ගේ ඉඩම ද, දකුණට : ත්‍යාගලාභීගේ මෙම ඉඩමේ ඉතිරි කොටස ද, නැගෙනහිරට පාර ද, බස්නාහිරට : ප්‍රමාණය උතුරේ සිට දකුණට අඩි 98 ක් සහ නැගෙනහිර සිට බස්නාහිරට : අඩි 48 ක් වන ත්‍යාගලාභීගේ ඉඩම

නැගෙනහිර පළාතේ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, තම්පලගාමම් පත්තුවේ කින්නියා ප්‍රාදේශීය ලේකම්ගේ කොට්ඨාසයේ කින්නියා ප්‍රාදේශීය

සභා සීමාව තුළ සින්නකින්නියා පිහිටි ත්‍රිකුණාමලය බලයලත් මිනින්දෝරු සහ තලම්තිකරු කේ. සෙල්ලපිල්ලේ විසින් අඳින ලද 2005.05.05 දිනැති අංක 4343 දරන සැලැස්මේ සඳහන් ඉඩමේ ලොට් 1 ලෙස මැන පෙන්නුම් කරනු ලබන කින්නියාතෝට්ටම් නමැති පෙර කී බෙදූ ඉඩම් කොටස සහ පරිශ්‍රය තුළ පර්චස් දාහතයි දශම තුනයි දෙකක් (අ. 0, රූ. 0, පර්. 17.32)විශාල ඉඩම. මෙය ත්‍රිකුණාමල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත් ඉරුව ඩී 59/98 හි යථා පරිදි ලියාපදිංචි කර තිබුණි.

4. නැගෙනහිර පළාතේ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, තම්බලාගම පත්තුව කින්නියා ප්‍රාදේශීය සභා සීමාව තුළ සින්නකින්නියා සහකාර ආණ්ඩුවේ ඒජන්තගේ කොට්ඨාසයේ පිහිටි කින්නියාතෝට්ටම් නමැති ඉඩම් කොටසට නැගෙනහිර දිශාවට බෙදූ කොටසින් ප්‍රමාණය අක්කර කාලක් වේ. මෙය කාමර හයක්, කුස්සියක් සමන්විත නිවසක් ළිඳ සහ එයට අදාල සියලු වෙනත් අයිතීන් සමග වේ.

දකුණු දිශාවට බෙදන ලද ඉඩම් කොටස එයට අයත් සියලු අයිතීන් සමග උතුරේ සිට දකුණට : අඩි 53 ක් සහ නැගෙනහිර සිට බස්නාහිරට : අඩි 100 ක් විශාල ඉඩම.

මෙය ත්‍රිකුණාමල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරුව ඩී 64/19 හි යථා පරිදි ලියාපදිංචි කර තිබුණි.

සින්නකින්නියා පිහිටි ත්‍රිකුණාමලය බලයලත් මිනින්දෝරු සහ තලම්තිකරු කේ. සෙල්ලපිල්ලේ විසින් අඳින ලද 2005.07.22 දිනැති අංක 4486 දරන සැලැස්මේ සඳහන් ලොට් 3 සහ ලෙස මැන පෙන්නුම් කරනු ලබන කින්නියා තෝටම් නමැති පෙර කී ඉඩම් කොටස සහ පරිශ්‍රය ප්‍රමාණයෙන් පර්චස් පහළොවයි දශම එකයි අටක් (අ. 0, රූ. 0 පර්. 15.18) බව හඳුනා ගන්නා ලදී.

5. නැගෙනහිර පළාතේ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, තම්පලාගාමම් පත්තුවේ කින්නියා සින්නකින්නියා සහකාර ආණ්ඩුවේ ඒජන්තගේ කොට්ඨාසයේ පිහිටි කින්නියාතෝට්ටම් නමැති ඉඩමේ ගිණිකොණ කොටසින් අක්කර දහයක් වන ඉඩම් කොටසින් දකුණු බාගා කොටසින් අක්කර බාගයක් (1/2) වන කොටස.

පෙර කී පරිදි පිහිටි ඉහත සඳහන් ඉඩමෙන් බස්නාහිරට දිශාවට බෙදූ ඉඩම් කොටස සහ එකී බස්නාහිර දිශාවට බෙදූ කොටස දැන් ත්‍යාගලාභී යයි කියනු ලබන ප්‍රමාණයෙන් අක්කර කාලක් (1/4). මෙය ත්‍රිකුණාමල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරුව ඩී 59/94 හි යථා පරිදි ලියාපදිංචි කර තිබුණි.

(සින්නකින්නියා පිහිටි ත්‍රිකුණාමලය බලයලත් මිනින්දෝරු සහ තලම්තිකරු කේ. සෙල්ලපිල්ලේ විසින් අඳින ලද 2005.07.22 දිනැති අංක 4486 දරන සැලැස්මේ සඳහන් ලොට් 1 ලෙස මැන පෙන්නුම් කරනු ලබන කින්නියා තෝටම් නමැති පෙර කී ඉඩම් කොටස සහ පරිශ්‍රය ප්‍රමාණයෙන් රූඩ් එකක් (අ. 0, රූ. 1, පර්. 0 ) බව හඳුනා ගන්නා ලදී.)

6. නැගෙනහිර පළාතේ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, තම්පලගාමම් පත්තුවේ කින්නියා සහකාර ආණ්ඩුවේ ඒජන්තගේ කොට්ඨාසයේ සින්නකින්නියා පිහිටි ත්‍රිකුණාමලය බලයලත් මිනින්දෝරු ආර්. මුරුගුපිල්ලේ විසින් අඳින ලද 1963.10.15 දිනැති අංක 643 දරන සැලැස්මේ සඳහන් ටීපී 49328 හි කොටසක් වශයෙන් දැක්වෙන කින්නියා තෝට්ටම් නමැති ඉඩමේ ලොට් ඒ දරන බෙදූ ඉඩම් කොටසින් අක්කර දහයක් පමණ වන මඩකලපුව ත්‍රිකුණාමලය ප්‍රධාන පාරට යාව ඊසාන දිශාවට බෙදන ලද අක්කර කාලට (1/4). මෙය ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරුව ඩී 49/12 හි යථා පරිදි ලියාපදිංචි කර තිබුණි.

(සින්නකින්නියා පිහිටි ත්‍රිකුණාමලය බලයලත් මිනින්දෝරු සහ තලම්තිකරු කේ. සෙල්ලපිල්ලේ විසින් අඳින ලද 2005.07.22 දිනැති අංක 4486 දරන සැලැස්මේ සඳහන් ලොට් 1 ලෙස මැන පෙන්නුම් කරනු ලබන කින්නියා තෝට්ටම් නමැති පෙර කී ඉඩම් කොටස සහ පරිශ්‍රය ප්‍රමාණයෙන් රූඩ් එකක් (අ. 0, රූ. 1, පර්. 0) බව හඳුනා ගන්නා ලදී.)

ඉහත සඳහන් දේපල 2011 ඔක්තෝබර් මස 06 වන දින පස්වරු 1.30 ට එම දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපලට පිවිසීම.*- කින්නියා ජැටියේ සිට මඩකලපුව මාර්ගය ඔස්සේ ඉදිරියට ගිය විට මාර්ගයේ දකුණු පස අදාල දේපල පිහිටා ඇත.

යෝජනා සම්මුති දැන්වීම.- රජයේ *ගැසට් පත්‍රයේ* 2010.05.14 වන දින පළ වී ඇති අතර ලංකාදීප සහ ඩේලිමිරර් පුවත්පත්වල 2010.04.26 වන දින ද තිනකුරල් පුවත්පතේ 2010.05.11 වන දින පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.*- සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරි බද්ද සහ ඒ වෙනුවට රජයෙන් හෝ පළාත් අධිකාරියෙන් පනවනු ලබන වෙනත් ඕනෑම බද්දක්, 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2000, 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 500, 6. සියලුම ප්‍රචාරක වියදම් ද ගැණුම් මිලෙන් ඉතිරි 90% ද විකිණීමේ දින සිට දින 30 ක් ඇතුලත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවා නිමකළ යුතුය.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : ප්‍රධාන කළමණාකරු (නීති) සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03, දු.ක. 011-2456285, 2456263, 2456284

තුසිත කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු
සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත, කොලොන්නාව,
දුරකථන අංක : 011-3068185, 011-2572940

09-323

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.